ගාල්ල මහා නගර සභාව
ගාල්ල දිස්ත්‍රික්කය

---------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 නොවැම්බර් 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2. තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ගාල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) 2002 වර්ෂයේ දී මහා නගර සභා බලප්‍රදේශයේ වැසි ජලය බැස යෑමේ කාණු පද්ධතියක් සැකසීමට වැය වූ රු.50,945,716 ක් හා සභාවේ ප්‍රයෝජනය සඳහා ලබා දී තිබූ රු.2,198,083 ක් වූ ගලි බවුසරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබීම නිසා වත්කම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු එකතුව රු.46,741,204 ක් වූ පොලිය ගිණුම් ගතකර නොතිබීම නිසා වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළ රු.3,222,277 ක් වූ උසාවි දඩ මුදල් ගිණුම් ගතකර නොතිබීම නිසා වර්ෂයේ ආදායම එකී ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) අවලංගු වූ කර්මාන්ත 11 ක් සඳහා එකතුව රු.6,036,123 ක මුදලක් ණයහිමියන් යටතේ වෙන් කර තිබීමෙන් ජංගම බැරකම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ලෙස ගෙවිය යුතු එකතුව රු.99,734,709 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම නිසා ජංගම බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

එකතුව රු.9,510,482 ක් වූ ගනුදෙනු සම්බන්ධව අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධිකතා හා ඌණතා ගිණුමින් ගැලපීම් කර තිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.168,978,725 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ උපයෝගී ලේඛන / උපලේඛන අනුව දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.38,080,702 ක අසමානතා නිරීක්ෂණය විය.

**1.3.4 අවිනිශ්චිත ගිණුම**

2003 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.111,553 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනා ගෙන අවශ්‍ය ගැලපීම් කර නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේ රු.232,143,510 ක් වූ ආදායම් ණයගැති ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.377,974,063 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ රු.269,735,791 ක් වූ ණයහිමි ශේෂය සමාලෝචිත වර්ෂයේ දී රු.317,819,678 ක් දක්වා වර්ධනය වී තිබූ අතර, එම ශේෂය විශ්ලේෂණය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.212,706,605 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධව යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය ද, රු.377,974,063 ක ණයගැතියන් හා රු.317,819,678 ක ණයහිමියන් සම්බන්ධව විධිමත්ව පවත්වන ලද ණයහිමි හා ණයගැති ලේඛන සහ කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) එකතුව රු.85,845,997 ක් වටිනා ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ වසර 03 කටත් අධික කාලයක් නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. ඊට අදාළ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව අතැති තොග ශේෂය හා තොග ලේඛන අනුව ඉදිරිපත් කරන ලද තොග ශේෂය අතර රු.69,291,675 ක වෙනසක් පැවැතුණ ද, ඒ සම්බන්ධව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.3.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනත** | |
| (i) 252 වගන්තිය | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) 103(1) වගන්තිය | සභාවේ ලිඛිත එකඟත්වය කලින් ලබා නොගෙන සභා බලප්‍රදේශයේ වූ ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කර තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 570 | වර්ෂ දෙකක කාලය ඉක්ම වූ එකතුව රු.4,832,310 ක පොදු තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2014 පෙබරවාරි 24 දිනැති අංක CSS/7/1/1/1 දරන ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛය | මුදල් හා ගබඩා භාරව සේවය කරන කිසිදු නිලධාරියකුගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.128,351,803 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ පුනරාවර්තන ආදායම රු.43,967,186 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.84,384,617 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම්**

(අ) සමාලෝචිත වර්ෂයේ දී රු.741,930 ක් වැයකර, නව පරිගණක මෘදුකාංගයක් ස්ථාපිත කර තිබූ බැවින් හා වරිපනම් ලේඛන යාවත්කාලීන කර නොතිබූ බැවින්

වර්ෂයේ ආරම්භක ශේෂය පිළිබඳ විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත් විය.

(ආ) 2015 හා 2016 වර්ෂවලට අදාළ හිඟ වරිපනම් බදු අයකිරීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 252(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. හිඟ වරිපනම් අයකිරීම වෙනුවෙන් ආදායම් එකතු කිරීමේ නිලධාරීන් 08 දෙනෙකු සඳහා රු.363,454 ක කොමිස් මුදලක් ගෙවා තිබුණ නමුත්, රු.66,114,672 ක් වූ හිඟ වරිපනම් බදුවලින් රු.1,871,399 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) නව වරිපනම් අංක ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ලැබුණු ගොනු 63 ක් අතුරින් ආදායම් පරීක්ෂකවරුන්ට ගොනු 60 ක් ලබා දී තිබුණ ද, තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කර තිබුණේ ගොනු 33 ක් පමණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 177 කින් රු.35,449,728 ක හිඟ වරිපනම් බදු ශේෂයක් නිරීක්ෂණය වූ අතර, ඒවා අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 2.2.2 බදු කුලී

---------

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.87,019,453 ක බදු මුදලින් වර්ෂය තුළ රු.53,965,613 ක් පමණක් අයකර තිබූ අතර, එය ලැබිය යුතු මුළු මුදලින් සියයට 62 ක අගයක් විය.

(ආ) 2010 වර්ෂයටත් පෙර සිට ගාල්ල පැරණි බස් නැවතුම්පොළ තුළ පිහිටි ගොඩනැගිලි බදුදීම වෙනුවෙන් රු.1,034,869 ක් හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් හා රුහුණු බස් සමාගමෙන් අයවිය යුතු රු.1,755,589 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදීත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.3 බලපත්‍ර ගාස්තු

---------------

(අ) සභා බලප්‍රදේශයේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට වෙළඳ බලපත්‍රයක් ලබා ගතයුතු නමුත්, මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය අවසානයට රු.6,047,154 ක හිඟ බලපත්‍ර ගාස්තු ශේෂයක් නිරීක්ෂණය විය. ඒ අනුව නීත්‍යානුකූල නොවන ආකාරයට සභා බලප්‍රදේශයේ ව්‍යාපාර පවත්වාගෙන ගොස් තිබුණ ද, ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) බලපත්‍ර ගාස්තු බිල් කිරීමේ දී වර්ෂයේ නඩු පැවරුම් ගාස්තු වූ රු.590,400 ක මුදල අඩුකර ශුද්ධ බිල් කිරීම පමණක් බලපත්‍ර ගාස්තු ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

## 2.2.4 වරෙන්තු ගාස්තු හා වෙනත් ආදායම්

----------------------------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.64,078,620 ක් වූ වරෙන්තු ගාස්තු හා වෙනත් ආදායම් වර්ෂය අවසානයට රු.200,396,371 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර, එය වර්ෂය ආරම්භක ශේෂයට වඩා සියයට 313 ක ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි. එමෙන්ම අනුමැතියකින් තොරව වර්ෂයේ ආරම්භක හිඟ ශේෂයෙන් රු.9,510,482 ක මුදලක් කපාහැර තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ)** **ආයුර්වේද අංශය**

(i) ආයුර්වේද අංශයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා ලබාදුන් ප්‍රතිපාදන පසුගිය වසර දෙක තුළ අඩුකර තිබුණි. එහෙත් පසුගිය වසර කිහිපය තුළ ආයුර්වේද අංශයෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණි රෝගීන් සංඛ්‍යාව වැඩි වී තිබූ බව ද නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය තුළ ආයුර්වේද අංශයේ ඖෂධ මිලදී ගැනීමට කිසිදු ප්‍රතිපාදනයක් ලබා දී නොතිබුණි.

(iii) 2016 වර්ෂයේ අයවැය ලේඛනය අනුව ආයුර්වේද අංශයේ සේවක සංඛ්‍යාව 06 ක් ලෙස දක්වා තිබූ නමුත්, සත්‍ය සේවක සංඛ්‍යාව 03 ක් වූයෙන් දෛනික කාර්යයන් ඉටුකර ගැනීමේ අපහසුතාවයන් ඇති වී තිබුණි.

(iv) අභ්‍යන්තර සේවා ගැටලුවක් නිසා ආයුර්වේද වෛද්‍යවරිය 2015 පෙබරවාරි 26 දින සිට පැමිණීමේ ලේඛනයේ පැමිණීම හා පිටවීම අත්සන් කර නොතිබුණි.

**(ආ)** **ඔප්පු සාරාංශ නිකුත් කිරීම**

සභාව විසින් සකස් කර ඇති පුරවැසි ප්‍රඥප්තිය අනුව වරිපනම් සංශෝධනය හා නව වරිපනම් අංක ලබාදීමට අදාළව ඔප්පු සාරාංශ දින 03 ක් ඇතුළත නිකුත් කරන බව දන්වා තිබූ නමුත්, 2017 ජූලි 07 දින තෙක් වැඩ අවසන් නොවූ අයදුම්පත් ගණන 724 ක් විය.

**3.2** **නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

මහා නගර සභාවේ ප්‍රයෝජනය සඳහා 2015 අගෝස්තු 30 දින මිලදී ගත් රු.59,900 ක් වටිනා වායුසමීකරණ යන්ත්‍රයක් 2017 ජූලි 17 දින වනතුරු නිශ්කාර්යයව ගබඩාවේ තැන්පත් කර තිබුණි.

**3.3** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු එකතුව රු.755,326 ක සේවක ණය මුදලක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් අතිරික්තව බඳවාගෙන තිබූ සේවකයින් 78 දෙනෙකු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, පුරප්පාඩු සේවකයින් 114 දෙනෙකු විධිමත් පරිදි බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා අරමුදලින් 2016 වර්ෂයේ සිදු කිරීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති 196 ක් අතුරින් ව්‍යාපෘති 11 ක් අවලංගු කර තිබූ අතර, ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 33 ක් 2017 ජූලි 07 දින වනවිටත් අවසන් කර නොතිබුණි.

(ඈ) වාහන පාලනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවේ ප්‍රයෝජනය සඳහා රාජ්‍ය ආයතනවලින් ලබාදුන් වාහන 06 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) වාහන 130 කට අදාළව මාසික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii) රියදුරන් බඳවා ගැනීමේ දී ඇප ලබාගෙන නොතිබුණි. 2016 දෙසැම්බර් 04 දින අංක LL – 6447 දරන ෆෝටෝන් රථයට සිදු වූ අනතුර සම්බන්ධ රු.388,616 ක අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාව සතු වෙළඳ පරිශ්‍ර බදුදීම් සහ ආදායම් රැස්කිරීම් සම්බන්ධව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව සතු වෙළඳ පරිශ්‍ර බදු දීමේ දී කාලීනව බදුකුලී සංශෝධනය කිරීමෙන් තොරව හා බදු ගිවිසුම් අළුත් කිරීමෙන් තොරව දිගින් දිගටම එකම බදුකරුවන්ට බදු දී තිබුණි.

(ii) ටැල්බට් ටවුම පළමු පටුමග කඩ අල්ලි 25 ක් අතරින් කඩහිමියන් 14 දෙනෙකු 2006 වර්ෂයේ සිට දිගින් දිගටම කඩ කුලී නොගෙවා තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට රු.1,989,642 ක හිඟ මුදලක් අයවීමට තිබුණ ද, මහා නගර සභා ආඥා පනතට අනුව කටයුතු කර නොතිබුණි.

(iii) අදාළ ආදායම් ලේඛනයට අනුව සභා බලප්‍රදේශයේ එළවළු වෙළඳසැල් 234 ක් පැවැතිය ද, ඉන් වෙළඳසැල් 58 ක් සඳහා 2016 වර්ෂය වෙනුවෙන් බිල් කිරීම් කර නොතිබුණි.

(iv) ඔරොප්පුවත්ත සුනාමි කඩ කාමර 93 ක් අතුරින් 2016 දෙසැම්බර් 31 දින වනවිට හිඟ බදු වටිනාකම රු.405,129 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම අදාළ බදුකරුවන් සමඟ ගිවිසුම් ගතවීමට ද කටයුතු කර නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ගාල්ල මහා නගර සභාවට අයත් මහ වීදිය අංක 80 දරන ගොඩනැගිල්ල නොවැම්බර් මස 10 දින වෙනත් පාර්ශවයකට පවරා දීමේ දී පැවරුම් ගාස්තු වූ රු.8,880,000 කින් රු.7,771,000 ක මුදලක් නව බදුකරු නගර සභාවට ගෙවා, ඉතිරි රු.1,109,000 ක මුදලට අදාළ ගොඩනැගිල්ලේ අළුත්වැඩියාවක් සිදු කිරීමට ගිවිසුම්ගතව තිබුණි. එසේම බදුකරුට වාසිදායක වන ආකාරයෙන් ගිවිසුම් සකස් කර තිබුණි.

(ආ) නගර සභාව විසින් විවිධ සේවාවන් සඳහා ලබා ගන්නා සේවා ගාස්තුවට අමතරව වෙනත් ගාස්තු ලෙස රු.428,512 ක් අයකර, නගර සභා ආඥා පනතට අනුකූල නොවී එම මුදලින් රු.398,373 ක මුදලක් අදාළ සේවාවන් ඉටුකරන ලද නිලධාරීන්ට ගෙවා තිබුණි.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---

සභා බලප්‍රදේශය තුළ දිනකට එකතු වන ටොන් 45 – 50 ක් පමණ කසළ වෙන් කිරීමෙන් ලබාගන්නා අතර, ඉන් සියයට 60 ක් පමණ වූ දිරන කසළ ගිවිසුම් පරිදි මොන්රෝවියාවත්තට බැහැර කරමින් තිබුණි. නොදිරන කොටස තුළ ඇතුළත් වීදුරු අලෙවි කර, ඉතිරි නොදිරන ද්‍රව්‍ය හීන්පැන්දල සභා භූමියකට බැහැර කිරීම නිසා වර්තමානය වනවිටත් ඉතා විශාල කසළ තොගයක් එකතු වී තිබුණි. නොදිරන කසළ කළමනාකරණය සඳහා දීර්ඝකාලීන සැලසුමක් සභාව සතුව නොතිබුණි. එමෙන්ම නොදිරන කසළ ගොඩගසා ඇති සභා භූමිය අසල පිහිටි ඇළ මාර්ගය ද අවහිර වී ප්‍රදේශයේ ජන ජීවිතයට අවදානමක් ඇතිවිය හැකි තත්ත්වයක් පැවතුණි.

**3.6 පාරිසරික ගැටළු**

---

නගර සභාව විසින් ජලය බැස යාම සඳහා ඉදිකර තිබූ පොදු කාණු පද්ධති සභාවේ අවසරයකින් තොරව කඩා, පෞද්ගලික නිවෙස්වල ජලය බැස යෑමට සලස්වා තිබූ අතර, ඇතැම් නිවෙස්වල අපජලය ඍජුවම පොදු කාණු පද්ධතිය වෙත හරවා තිබුණි. එසේම පොදු කාණු මත ඇතැම් ඉදිකිරීම් කර තිබූ අතර, ඊට අදාළ කිසිදු පියවරක් මහා නගර සභාව ගෙන නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

---

**(අ) බාහිර පාර්ශවයන්ට ලබා දී ඇති වත්කම්**

---

(i) මහා නගර සභාවේ සභිකයින් සඳහා රු.1,460,300 ක් වටිනා ලැප්ටොප් 17 ක් මිලදී ගෙන බෙදාහැර තිබූ අතර, සභාව විසුරුවා හැරීමේ දී සභිකයින් 12 දෙනෙකු එම ලැප්ටොප් නැවත සභාව වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණි. එසේම එක් සභිකයෙකුගේ ලැප්ටොප් යන්ත්‍රය සොරා ගෙන යෑම පිළිබඳව පොලිස් පැමිණිල්ලක් කර තිබුණි. මෙම භාර නොදුන් පරිගණක සහ සොරා ගත් පරිගණකය සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් මහා නගර සභා බලධාරීන් විසින් ගෙන නොතිබුණි.

(ii) සභිකයින්ගේ ප්‍රයෝජනය සඳහා එකතුව රු.791,982 ක මුදලක් සභා අරමුදලින් වැයකර ටැබ් 18 ක් සහ රු.90,000 ක් වැයකර පවර් බැන්ක් 20 ක් සහ ටැබ් කවර 17 ක් මිලදී ගෙන, සභිකයින්ට ලබා දී තිබුණි. සභාව විසුරුවාහැරීමෙන් පසු සභිකයින් 11 දෙනෙකු අදාළ උපකරණ නැවත ලබා දී නොතිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

(i) නගර සභාවට අයත් රජයේ නිවාස 05 ක් සම්බන්ධව ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 6.15 වගන්තියට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ii) සභාවට අයත් රජයේ නිවාස 24 ක් පවතින නමුත්, අදාළ රජයේ නිවාස ලේඛනයට නිවාස 21 ක් පමණක් ඇතුළත් කර තිබූ අතර, නිවාස 12 ක් දැනට භාවිතයට ගත නොහැකි මට්ටමේ පැවතුණි. ඒවා අළුත්වැඩියා කර, භාවිතයට සුදුසු මට්ටමකට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක එකතුව රු.158,258,904 ක් වූ ඉතිරිවීම් ද, එක් වියදම් විෂයයක රු.6,506,945 ක අහිතකර විචලනයන් ද, ආදායම් විෂයයන් 05 ක රු.94,270,676 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේ දී විගණකාධිපතිගේ එකඟත්වය ලබාගෙන නොතිබූ අතර, මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සභාව මඟින් පිහිටුවා තිබුණු අභ්‍යන්තර විගණන ඒකකයට කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 04 දෙනෙකු සහ කාර්යාල කාර්යය සහායකයකු අනුයුක්ත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණන නිරීක්ෂණ 09 ක් පමණක් නිකුත් කර තිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් පන්ති අනුව වෙන් වෙන්ව විස්තර දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | ඇතැම් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නිකුත් කිරීමෙන් තොරව නිෂ්ක්‍රීයව ගබඩාව තුළ පැවතුණි. |
| | | (iii) | වත්කම් වෙන්දේසි කළ පසු ඒවායේ පිරිවැය හඳුනාගෙන වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | වාහන පාලනය | (i) | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | සභාවට අයත් කිසිදු වාහනයක දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| | | (iii) | සභාව පාවිච්චි කරනු ලබන වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | වර්ෂ කිහිපයක සිට පැවැත එන අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එනු ලබන ගිණුම් ශේෂ පිළිබඳව සොයා බලා, අවශ්‍ය ගැලපීම් කර, ගිණුම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | වරිපනම් මෘදුකාංගය හෝ ලේඛන මඟින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට නොහැකි වී තිබුණි. |
| | | (iv) | මූල්‍ය ප්‍රකාශන හා ලේඛන අතර පවතින ශේෂ වෙනස්කම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නිසි වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කර නොතිබුණි. |

(ii) මුද්දර ගාස්තු ආදායම සඳහා වෙන් කිරීම පසුගිය වසරවල ආදායම පිළිබඳව සැලකීමෙන් තොරව ඇස්තමේන්තුගත අගය ගිණුම්ගත කර තිබුණි.

(iii) මුද්දර ගාස්තු, උසාවි දඩ මුදල් වැනි ආදායම් යාවත්කාලීනව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iv) නව වරිපනම් අංක ලබාදීමේ දී වැඩ අවසන් කළ ගොනු සංඛ්‍යාව පහළ අගයක් ගෙන තිබුණි.

(v) සභාව සතු ඇතැම් පොදු වෙළඳපොලවල් වෙනුවෙන් වර්ෂයට අදාළ බිල් කිරීම් කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) අනුමත සේවක සංඛ්‍යා සැලැස්මේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගැනීමට හෝ අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>(ii) අයවිය යුතු සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | අයවැය පාලනය | අයවැය පිළිබඳව පසු විපරම් කර, සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (උ) | ණයගැති සහ ණයහිමි පාලනය | (i) කර්මාන්ත ණයහිමියන් ලෙස වෙන්කර පසුව අවලංගු වූ ව්‍යාපෘතිවල වටිනාකම අදාළ ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි.<br>(ii) ණයගැති හා ණයහිමි ශේෂ සම්බන්ධව විධිමත්ව ණයගැති හා ණයහිමි ලේඛන සහ කාලවිශ්ලේෂණ සකස් කර නොතිබුණි.<br>(iii) දීර්ඝ කාලයක සිට පැවත එන ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |